## ජනාධිපති කාර්යාලය

### ජනාධිපති නීතිඥවරයන් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම - 2022/2023

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාර ව 2022 සහ 2023 වර්ෂ සඳහා ජනාධිපති නීතිඥවරයන් පත්කිරීමට සුදුසුකම් සහිත පුද්ගලයින් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා 2021 නොවැම්බර් මස 24 දිනැති 2255/24 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද මාර්ගෝපදේශ අනුව පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ට අයදුම් කළ හැකිය.

01. i. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වන;

ii. නීතිඥ වෘත්තියේ විශිෂ්ටත්වයට පත් ව ඇති සහ පැවැත්මේ සහ වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙ හි උත්කෘෂ්ට තත්ත්වයක් පවත්වාගෙන යන;

iii. (*අ*) ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණයක නීති තර්ක තුළින් සක්‍රීය දායකත්වයක් ලබා දී ඇති;

හෝ

(*ආ*) නීතියේ උන්නතිය උදෙසා නීති තර්ක තුළින් සක්‍රීය දායකත්වයක් ලබා දී ඇති;

හෝ

(*ඇ*) රාජ්‍ය අංශයේ හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ජාත්‍යන්තරව පිළිගත් ආයතනයක හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නීති විෂයයෙ හි විශේෂඥයකු ලෙස සුවිශේෂී සහ විශිෂ්ට දායකත්වයක් ලබා දී තිබීම හෝ ශ්‍රී ලංකාවට කීර්තියක් හෝ ගෞරවයක් අත්කර දී ඇති;

iv. යහපත් චරිතයකින් සහ කීර්තිනාමයකින් යුක්ත වන;

v. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර නොමැති;

vi. නීතියේ ආධිපත්‍යයට හෝ අධිකරණයේ ස්වාධීනත්වයට හානි පමුණුවන හෝ බිඳ හෙලන කිසිදු ක්‍රියාවක නිරත වී නොමැති;

vii. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් විනය නියෝගයකට ලක්කර නොමැති, අධිකරණයක් විසින් වෘත්තීමය විෂමාචාරයක් හෝ අකටයුත්තක් සඳහා වරදකරු කර නොමැති, අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු කර නොමැති, රථ වාහන ආඥාපනත යටතේ සුළු වරදකට හැර දේශීය හෝ විදේශීය අධිකරණයක් විසින් කිසිදු වරදකට වරදකරු කර නොමැති, සහ බුන්වත් නොවූ;

viii. ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත්වීම සඳහා වූ අයදුම්පත ඔහු / ඇය ඉදිරිපත් කිරීමට පෙර, අවම වශයෙන් අවුරුදු පහක කාලයක් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, ආදායම් බදු ගෙවන්නෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති; පුද්ගලයෙකු වීම.

02. නීතිය සහ/හෝ නීති පද්ධතිය පිළිබඳ ග්‍රන්ථ, ලේඛන ප්‍රසිද්ධ කර තිබීම, ජාතික හෝ ජාත්‍යන්තර සමුළු සඳහා පත්‍රිකා ඉදිරිපත් කර තිබීම, ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ආයතන මගින් නීතිය පිළිබඳ වැඩිදුර හදාරා තිබීම, පිළිගත් උසස් අධ්‍යාපන ආයතන තුළ නීති විෂයය උගන්වා තිබීම, නීතියේ නව අවකාශයන් පිළිබඳ යාවත්කාලීන වූ දැනුම සහිතවීම සහ අර්ථවත් ලෙස වෘත්තියට දායකත්වය සපයන කනිෂ්ඨ නීතිඥවරයන් පුහුණු කර තිබීම, ජනාධිපති නීතිඥවරයන් පත්කිරීමේ දී අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

03. අයදුම්කරු අවම වශයෙන් වසර විස්සක (20) කාලයක් තුළ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වශයෙන් කටයුතු කර තිබිය යුතුය. [විශේෂිත අවස්ථාවන්හි දී අනෙකුත් සියලුම නිර්ණායකයන් සපුරා ඇති, වසර පහළොවක (15) සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන් ද ජනාධිපති නීතිඥවරයන් ලෙස පත්කිරීමට සළකා බලනු ලැබේ.]

04. අයදුම්කරු නොතාරිස්වරයකු ලෙස සේවයේ යෙදී සිටීම නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර අයදුම්කරු විසින් කෙලින් ම හෝ වක්‍රව තුන්වන පාර්ශ්වයක් මගින් අදාළ අයදුම්පත සම්බන්ධ ව හෝ ජනාධිපති නීතිඥවරයෙකු වශයෙන් පත් කිරීම සම්බන්ධ ව කිසිදු බලපෑමක් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ඇත.

05. යම් අයදුම්කරුවෙකු විසින් තම අයදුම්පත මගින් සාවද්‍ය තොරතුරු ලබාදීමක් හෝ කූට ලේඛන ඉදිරිපත් කිරීමක් හෝ කරුණු වසන් කිරීමක් සිදු කර ඇති විට එම ඉල්ලුම් පත්‍රය එනයින් ම ප්‍රතික්ෂේප වූ ලෙස සළකනු ලැබේ.

මේ සමග දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද ලිඛිත අයදුම්පත් අදාළ ලියකියවිලිවල සහතික කළ පිටපත් ද සමගං, **2023 අගෝස්තු මස 25 දින හෝ ඊට පෙර** ''ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය, කොළඹ 01'' යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරෙ හි "ජනාධිපති නීතිඥවරයන් පත්කිරීම - 2022/ 2023" යන්න පැහැදිලි ලෙස ලිවිය යුතුය.

අයදුම්පත්‍රය www.presidentsoffice.gov.lk ඔස්සේ ද බාගත කළ හැකිය.

ඊ. එම්. එස්. බී. ඒකනායක,
ජනාධිපති ලේකම්.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජනාධිපති නීතිඥවරයන් පත්කිරීම - 2022/2023**

01. (i). සම්පූර්ණ නම :————.
(ii). සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. උපන් දිනය :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. (i). ස්ථිර ලිපිනය :————.

(ii). ඉලෙක්ට්‍රොනික ලිපිනය (e-mail) :————.

05. දුරකථන අංක :
(i). ජංගම :————.
(ii). ස්ථාවර :————.

06. ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද නැද්ද යන වග :————.

07. අධ්‍යාපන සුදුසුකම් :

| *සුදුසුකම* | *ආයතනය* | *ලබාගත් වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

08. වෘත්තීය සුදුසුකම් :

(i). ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

(ii). නීතිඥ වෘත්තියේ කටයුතු කර තිබෙන අධිකරණ පිළිබඳ විස්තර :

| *අධිකරණයේ නම* | *අධිකරණ බල ප්‍රදේශය* | *කාල පරිච්ඡේදය* |
|---|---|---|
| | | |

(iii). වෙනත් වෘත්තීය සුදුසුකම් :————.

| *සුදුසුකම* | *ආයතනය* | *ලබාගත් වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |

09. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි වී ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :————.

(i) ලියාපදිංචි අංකය :————.
(ii) ශාඛාව: :————.
(iii) දිස්ත්‍රික්කය :————.

10. (i). නොතාරිස් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් එහි අංකය :————.

(ii). නොතාරිස්වරයෙකු වශයෙන් කටයුතු කර ඇත්නම්/ කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර කාලවකවානු ද සමග :————.

11. පසුගිය වසර 5ක කාල පරිච්ඡේදය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නකු වශයෙන් ලියාපදිංචි වී තිබේද නැද්ද යන වග :- ඇත ☐ / නැත ☐

ලියාපදිංචි වී ඇත්නම්,

(i). ලියාපදිංචි අංකය :————.

(ii). බදු ගෙවා තිබේ ද නැද්ද යන වග :————.

12. අමතර සුදුසුකම් :

ජනාධිපති නීතිඥවරයන් පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙ හි අංක 02 ඡේදය යටතේ දක්වා ඇති අමතර සුදුසුකම් සපුරා තිබේනම්, එකී අමතර සුදුසුකම් පිළිබඳව විස්තර වෙන් වෙන් වශයෙන් මේ යටතේ සඳහන් කළ යුතුය. :————.

13. වෙනත් සුදුසුකම් :————.

ඉහත කරුණුවලට අමතරව ජනාධිපති නීතිඥවරයකු වශයෙන් පත්කිරීම සඳහා සලකා බැලිය හැකි වෙනත් කරුණු ඇත්නම් මේ යටතේ සඳහන් කළ යුතුය. :————.

14. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනකු පිළිබඳ විස්තර :

01. නම :————.
තනතුර/ වෘත්තිය :————.
දුරකථන අංකය :————.
ඉලෙක්ට්‍රොනික ලිපිනය :————.

02. නම :————.
තනතුර/ වෘත්තිය :————.
දුරකථන අංකය :————.
ඉලෙක්ට්‍රොනික ලිපිනය :————.

15. .............................. වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කර නොමැති බවත්, නීතියේ ආධිපත්‍යයට හෝ අධිකරණයේ ස්වාධීනත්වයට හානි පමුණුවන හෝ බිඳ හෙලන කිසිදු ක්‍රියාවක නිරත වී නොමැති බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් විනය නියෝගයකට ලක්කර නොමැති සහ අධිකරණයක් විසින් වෘත්තීමය විෂමාචාරයක් හෝ අකටයුත්තක් සඳහා වරදකරු කර නොමැති බවත්, අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු කර නොමැති බවත්, රථ වාහන ආඥාපනත යටතේ සුළු වරදකට හැර දේශීය හෝ විදේශීය අධිකරණයක් විසින් කිසිදු වරදකට වරදකරු කර නොමැති බවත්, බුන්වත් නොවූ අයෙකු බවත්, යහපත් චරිතයකින් සහ කීර්තිනාමයකින් යුක්තවන බවත්, සහ ඉහත ම විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහ අවශ්‍ය තොරතුරු යටපත් කිරීමක් කර නොමැති බවත් මෙයින් සහතික කර ප්‍රකාශ කරමි.

————————,
අත්සන.

දිනය :————.

08-797

